රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 'බී' අර්ථසාධක අරමුදල

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 'බී' අර්ථ සාධක අරමුදලේ මල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2010 හා 2011 වර්ෂ තුළදී පිළිවෙලින් රු.132,762 ක් හා රු. 122,505 ක් වූ පොළිය ගණනය කර සාමාජික ගිණුම්වලට බැර කර නොතිබුණි. ඒ අනුව, සාමාජික ගිණුම්වලට බැර කරන ලද පොලිය හා අතිරේක දායක මුදල රු.255,567 කින් අඩුවෙන් දැකවුණි.

(ආ) පොළී ආදායමේ සාවද්‍ය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජන ආදායම රු.22,678 කින් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1979 ජූනි 01 සිකුරාදා දිනැති අංක 38/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය - 04 රීතිය | සාමාජිකයන්ගේ බැරට පවත්නා සියළුම මුදල් ඕනැම රජයේ බැංකුවක හෝ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතු වුවත්, සියළුම අරමුදල් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. |

## 2 <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ සාමාජිකයින්ගේ ගිණුම්වලට බැර කරන ලද පොලිය රු.1,813,064 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය තුළ සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද පොලිය රු.2,121,491ක් වූයෙන් රු.308,427 කින් එනම්, 14.54% කින් මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමක් දැක්වුණි. මෙම සෘණ උපනතියට සමාලෝචිත වර්ෂය තුළ සාමාජිකයන්ගේ මුළු දායකය අඩුවීම මෙන්ම පොලී අනුපාතිකය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ඉකුත් වර්ෂ 3 තුළ හා සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය පහත දැක්වේ.

| | | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| (i) | ස්ථාවර තැන්පතු මත පොලී ආදායම හා ඉතිරි කිරීම් ගිණුම් | 1,675,320 | 1,976,387 | 2,417,405 | 1,775,210 |
| (ii) | සාමාජිකයන්ට දෙන ලද ණය මත පොලී ආදායම | 67,197 | 89,225 | 73,230 | 92,179 |
| (iii) | ජනනයවූ මුළු පොලී ආදායම | 1,742,517 | 2,065,612 | 2,490,635 | 1,867,389 |
| (iv) | බදු වියදම් | (181,306) | (212,149) | (284,719) | (215,014) |
| (v) | ශුද්ධ පොලී ආදායම | 1,561,211 | 1,853,463 | 2,205,916 | 1,652,375 |
| (vi) | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් කරන ලද අතිරේක දායකය | 251,853 | 268,028 | 626,569 | 497,011 |
| (vii) | සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද මුළු පොලිය | 1,813,064 | 2,121,491 | 2,832,485 | 2,149,386 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 සිට 2011 කාල පරිච්ඡේදය තුළදී ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීම් ගිණුම් මත පොළී ආදායම රු.1,775,210 සිට රු.1,675,320 දක්වා එනම්, 5.63% කින් අඩුවී තිබුණි.

(ආ) 2008 සිට 2011 කාල පරිච්ඡේදය තුළදී, සාමාජිකයන්ට දෙන ලද ණය මත පොළී ආදායම රු.92,179 සිට රු.67,197 දක්වා එනම්, 27.10% කින් අඩුවී තිබුණි.

(ඇ) 2008 සිට 2011 කාල පරිච්ඡේදය තුළදී අතිරේක දායකය රු.497,011 සිට රු.251,853 දක්වා එනම්, 49.32% කින් අඩු වී තිබුණු අතර, සාමාජිකයන්ගෙ ගිණුම්වලට බැර කරන ලද මුළු පොළිය රු.2,149,386 සිට රු.1,813,064 දක්වා එනම්, 15.65% කින් සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි.

## 2.2 සාමාජිකයන්ට ලබා දුන් ණය

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂය තුළ සාමාජිකයන්ට ලබා දෙන ලද ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | 2011 | 2010 |
| | රු. | රු. |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 1,534,010 | 1,525,241 |
| එකතු කළා: | | |
| වර්ෂය තුළ සාමාජිකයින්ට ලබා දුන් ණය | 120,000 | 200,000 |
| | 1,654,010 | 1,725,241 |
| අඩු කළා : | | |
| වර්ෂය තුළ අයකර ගත් මුදල | 761,543 | 191,231 |
| ඉදිරියට ගෙන ගිය ශෙෂය | 892,467 | 1,534,010 |

2010 වර්ෂය සමඟ සැසඳීමේදී 2011 වර්ෂයේ සාමාජිකයන්ට ලබා දුන් ණය රු.80,000 කින් එනම්, 40% කින් අඩු වී තිබුණු අතර, 2011 වර්ෂය තුළදී අයකර ගැනීම් රු.570,312 කින් එනම්, 2.98% කින් වැඩි වී තිබුණි.

## 2.3 සාමාජික දායකත්වය

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයෙ සාමාජික දායකත්වය, බැංකු දායකත්වය හා සාමාජික ගිණුම්වලට බැර කරන ලද පොලී පහත දැක්වේ.

| | 2011 | | | | 2010 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික දායකත්වය | බැංකුවේ දායකත්වය | බැර කරන ලද පොලී | එකතුව | සාමාජික දායකත්වය | බැංකුවේ දායකත්වය | බැර කරන ලද පොලී | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 3,811,759 | 5,709,077 | 12,871,285 | 22,392,121 | 3,500,191 | 5,241,726 | 10,749,794 | 19,491,711 |
| එකතු කළා : | | | | | | | | |
| වර්ෂය තුළ දායකත්වය | 292,647 | 438,971 | 1,813,064 | 2,544,681 | 311,568 | 467,351 | 2,121,491 | 2,900,410 |
| එකතුව | 4,104,406 | 6,148,048 | 14,684,349 | 24,936,802 | 3,811,759 | 5,709,077 | 12,871,285 | 22,392,121 |
| අඩු කළා : | | | | | | | | |
| වර්ෂය තුළ ගෙවීම් | 778,857 | 1,166,196 | 2,532,997 | 4,478,050 | නැත | නැත | නැත | නැත |
| **ඉදිරියට ගෙන යන ලද ශේෂය** | **3,325,549** | **4,981,852** | **12,151,352** | **20,458,752** | **3,811,759** | **5,709,077** | **12,871,285** | **22,392,121** |

2010 වර්ෂය සමහ සැසඳීමේදී 2011 වර්ෂයේ අරමුදලට මුළු දායකය රු.355,729 කින් එනම්, 12.26% කින් අඩුවී තිබුණු අතර, 2010 වර්ෂය සමහ සැසදීමේදී රු.4,478,050 ක මුදලක් 2011 වර්ෂයේ සාමාජිකයන්ට ගෙවා තිබුණි.

## 3. මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකුව විසින් අවස්ථා 4 කදී අඩු පොළී ප්‍රතිශතයකට වර්ෂ 2 සිට වර්ෂ 3 ක කාල පරිච්ඡේද සඳහා රු.5,762,473 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. 2011 වර්ෂය අවසානය වන විට පොළී අනුපාතිකය සීඝ්‍රයෙන් වැඩි වී තිබුණි. මාස තුන වැනි කෙටි කාලයක් සඳහා අරමුදල් ආයෝජනය කළේ නම් 3% ක අතිරේක අවම පොලියක් උපයා ගත හැකිව තිබුණි. විස්තර පහත පරිදි වේ.

| ස්ථාවර තැන්පතු අංකය | කාල පරිච්ඡේදය | මුදල | පොළී අනුපාතිකය | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | | රු. | % | |
| 12 ටී/2098 | 2011 නොවැ 16 - 2013 නොවැ 15 | 1,130,356 | 9 | වර්ෂ දෙකක් |
| | 2011 අගෝ 13 - 2014 අගෝ 13 | 517,591 | 10 | වර්ෂ තුනක් |
| 24ටී/17307 | 2011 දෙසැ 27 - 2013 දෙසැ 27 | 974,943 | 10.50 | වර්ෂ දෙකක් |
| 36ටී/3151 | 2011 සැප් 29 - 2013 සැප් 28 | 3,139,582 | 9 | වර්ෂ දෙකක් |
| | | 5,762,473 | | |

(ආ) කල් පිරීමේ දිනවලට පෙර ස්ථාවර තැන්පතු ආපසු ගැනීම හේතුවෙන් පහත දැක්වෙන ආයෝජනවලට අදාලව ලැබිය යුතු මුළු පොලිය අඩුවීම නිසා අරමුදලට පාඩු සිදු වී තිබුණි.

| තැන්පතු කාලපරිච්ඡේදය | මුදල | පොලී අනුපාතිකය | ආපසු ගැනීමේ දිනය | 2011 පැවති දින ගණන |
|---|---|---|---|---|
| | රු. | % | | |
| 2011 අප්‍රේල් 15 - 2011 ජූලි 15 | 184,519.17 | 7 | 2011 ජූනි 09 | 52 |
| 2011 මැයි 03 - 2011 දෙසැ 31 | 328,915.64 | 10 | 2011 ජූනි 09 | 36 |
| 2011 මැයි 07 - 2013 මැයි 07 | 1,224,000.00 | 10 | 2011 ජූනි 09 | 32 |
| 2011 මැයි 12 - 2012 මැයි 12 | 654,000.00 | 10 | 2011 ජූනි 09 | 29 |

(ඇ) අර්ථ සාධක අරමුදල් දායකයන් හා වෙනත් ලැබීම් අරමුදලේ ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි. රු.128,000 සිට රු.1,000,000 දක්වා වූ ශේෂයක් කිසිදු පොලී ඉපැයීමක් නොමැතිව මෙම ජංගම ගිණුමේ පැවතුණි. මෙම තැන්පතු දින 7 ක

ක්ෂණික තැන්පතුවල හෝ කෙටි කාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළේ නම් අරමුදලට 7% කට සමාන රු.28,000 ක පොලියක් උපයා ගත හැකිව තිබුණි.